සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I |
| புவியியல் | I |
| Geography | I |

22 S I

**උපදෙස්:**

- ❊ **II** කොටසෙහි ප්‍රශ්න දෙකට ම පිළිතුරු සැපයිය යුතු ය.
- ❊ **III** කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර ඉන් තෝරාගත් ප්‍රශ්න **දෙකකට පමණක්** පිළිතුරු සැපයිය යුතු ය.
- ❊ මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා 1:50 000 භූ ලක්ෂණ සිතියමක කොටසක්, ලෝක ආකෘති සිතියමක්, ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක සිතියමක් සහ ප්‍රස්තාර කඩදාසි 2 ක් සපයනු ලැබේ.

## II කොටස

**1.** ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරන ලද 1:50 000 පරිමාණයේ මොණරාගල භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ච රේඛා අන්තරය අඩි 100 ලෙස දක්වා ඇත. එම සිතියම පාදක කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**සැලකිය යුතුයි:**

- ❊ ප්‍රශ්නයට අදාළ අංකය සහ අදාළ උප කොටස්වල අංක පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව සඳහන් කළ යුතු ය.
- ❊ පිළිතුරු භූ ලක්ෂණ සිතියමෙහි ලිවිය යුතු නොවේ.
- ❊ සපයා ඇති භූ ලක්ෂණ සිතියම ඔබේ පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතු නොවේ.

(i) සිතියම් ප්‍රදේශයේ Ⓐ මගින් සලකුණු කර ඇති ස්ථානයේ භූ ලක්ෂණය නම් කරන්න. (ලකුණු 01)

(ii) සිතියම් ප්‍රදේශයේ නිරිතදිග මායිම සහ උතුරු මායිම අතර දිවෙන ප්‍රධාන මාර්ගයේ (A4) දිග කිලෝමීටරවලින් ගණනය කරන්න. (ලකුණු 02)

(iii) Ⓑ - Ⓒ, Ⓓ - Ⓔ සහ Ⓕ - Ⓖ රේඛා මගින් දැක්වෙන භූ ලක්ෂණ **තුන** නම් කරන්න. (ලකුණු 03)

(iv) සිතියම් ප්‍රදේශයේ දක්නට ලැබෙන ජනාවාස වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(v) Ⓗ චතුරස්‍රයේ දක්නට ලැබෙන රාජ්‍ය ආයතන **හතරක්** නම් කරන්න. (ලකුණු 02)

(vi) සිතියම් ප්‍රදේශයේ Ⓙ - Ⓚ ලෙස සලකුණු කර ඇති රේඛාව ඔස්සේ හරස්කඩක් ඇඳ එහි උන්නතාංශ රටාව විස්තර කරන්න. (සපයා ඇති ප්‍රස්තාර කඩදාසියක් ඒ සඳහා භාවිත කරන්න.) (ලකුණු 04)

(vii) Ⓛ චතුරස්‍රයෙහි දක්නට ලැබෙන ඕනෑම භූමි පරිභෝග වර්ග **තුනක්** නම් කර ඒවායේ ව්‍යාප්ති රටාව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(එකතුව = ලකුණු 20)

**2.** සම්මත වර්ණ සහ සංකේත භාවිත කර සපයා ඇති ලෝක සිතියමේ පහත සඳහන් දෑ සලකුණු කර නම් කරන්න.

- ඇලස්කාව
- බෙන්ගුවෙලා දියවැල
- ෆුජියාමා ගිනි කන්ද
- උතුරු මුහුද
- කාපෙන්ටේරියා බොක්ක
- පැටගෝනියා කාන්තාරය
- ඇට්ලස් කඳු
- ඉන්දු ගඟ
- 2024 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ දේශගුණ වෙනස්වීම් පිළිබඳ සමුළුව (UNCCC) පවත්වන ලද නගරය
- 2024 වර්ෂයේ දී ලෝක සන්තුෂ්ටි වාර්තාවට අනුව ලොව ප්‍රීතිමත් ම රට (ලකුණු 10)

[හත්වැනි පිටුව බලන්න.

## III කොටස

3. (i) 'ප්‍රශ්නාවලියක්' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

(ii) හොඳ ප්‍රශ්නාවලියක් සකස් කිරීමේ දී ප්‍රයෝජනවත් යැයි සැලකෙන ලක්ෂණ තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(iii) ප්‍රශ්නාවලි සමීක්ෂණයක් සඳහා භාවිත කරන සම්මුඛ පරීක්ෂණ ක්‍රමයේ වාසි දෙකක් සාකච්ඡා කරන්න. (ලකුණු 04)

(iv) ප්‍රශ්නාවලි සමීක්ෂණයේ දී (a) ප්‍රශ්නාවලියක් තැපෑලෙන් යැවීම සහ (b) ප්‍රතිචාරකයාට දුරකථනයෙන් කථා කිරීම මගින් දත්ත සහ තොරතුරු ලබා ගැනීම යන එක් එක් ක්‍රමයට අදාළව අවාසි දෙක බැගින් පරීක්ෂා කරන්න. (ලකුණු 06)

4. (i) 'නවීන සිතියම් විද්‍යාව' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

(ii) නවීන සිතියම් විද්‍යා තාක්ෂණයෙහි පොදු ලක්ෂණ තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(iii) නවීන සිතියම් විද්‍යා තාක්ෂණය භාවිතයෙන් සිතියම් සකස් කිරීමට පවතින දත්ත මූලාශ්‍ර දෙකක් විස්තර කරන්න. (ලකුණු 04)

(iv) ආපදා කළමනාකරණය සඳහා භාවිත කළ හැකි නවීන සිතියම් විද්‍යා ශිල්ප ක්‍රමවල ප්‍රයෝජන තුනක් පරීක්ෂා කරන්න. (ලකුණු 06)

5. 2013/14 වර්ෂවල ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව කර්මාන්ත සංඛ්‍යාව වගුව 01 හි දක්වා ඇත. එම දත්ත භාවිත කරමින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**වගුව 01 : ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව කර්මාන්ත සංඛ්‍යාව - 2013/14**

| දිස්ත්‍රික්ක | කර්මාන්ත සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 28,648 |
| ගම්පහ | 32,651 |
| කළුතර | 15,154 |
| මහනුවර | 15,455 |
| මාතලේ | 7,653 |
| නුවරඑළිය | 4,059 |
| ගාල්ල | 11,745 |
| මාතර | 13,256 |
| හම්බන්තොට | 11,647 |
| යාපනය | 7,887 |
| මන්නාරම | 829 |
| මුලතිව් | 921 |
| වව්නියාව | 1,722 |

| දිස්ත්‍රික්ක | කර්මාන්ත සංඛ්‍යාව |
|---|---|
| කිලිනොච්චිය | 1,136 |
| මඩකලපුව | 9,009 |
| අම්පාර | 7,057 |
| ත්‍රිකුණාමලය | 3,064 |
| කුරුණෑගල | 24,544 |
| පුත්තලම | 12,866 |
| අනුරාධපුරය | 11,048 |
| පොළොන්නරුව | 6,178 |
| බදුල්ල | 6,138 |
| මොණරාගල | 5,275 |
| රත්නපුරය | 11,216 |
| කෑගල්ල | 8,772 |

මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, *2013/14*

[අටවැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(i) ඉහත **වගුව 01** හි දක්වා ඇති දත්ත භාවිත කර (a) සංඛ්‍යාතය, (b) සමුච්චිත සංඛ්‍යාතය සහ (c) සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය ගණනය කොට **වගුව 02** සම්පූර්ණ කරන්න.
(මේ සඳහා **වගුව 02** ඔබගේ පිළිතුරු පත්‍රයට පිටපත් කර ගන්න). (ලකුණු 03)

**වගුව 02 : - සංඛ්‍යාත වගුව**

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය (a) | සමුච්චිත සංඛ්‍යාතය (b) | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය (c) |
|---|---|---|---|
| 1 – 5,000 | | | |
| 5,001 – 10,000 | | | |
| 10,001 – 15,000 | | | |
| 15,001 – 20,000 | | | |
| 20,001 – 25,000 | | | |
| 25,001 – 30,000 | | | |
| 30,001 – 35,000 | | | |

(ii) ඔබ විසින් ඉහත (i) හි සම්පූර්ණ කර ඇති **වගුව 02** ඇසුරෙන් ඔගිව් වක්‍රයක් නිර්මාණය කරන්න (ඒ සඳහා සපයා ඇති ප්‍රස්තාර කඩදාසියක් භාවිත කරන්න). (ලකුණු 05)

(iii) ප්‍රස්තාරික නිරූපණයක් ලෙස ඔගිව් වක්‍රයේ වාසි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(iv) ශ්‍රී ලංකාවේ කර්මාන්තවල භූගෝලීය ව්‍යාප්තියේ කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 03)

**6.** 2024 වර්ෂයේ දිස්ත්‍රික්ක අනුව ශ්‍රී ලංකාවේ ජනගහනය **වගුව 03** මගින් දක්වා ඇත. එම දත්ත භාවිත කරමින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**වගුව 03 : - ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව ජනගහනය - 2024 ('000)**

| අංකය | දිස්ත්‍රික්ක | ජනගහනය ('000) |
|---|---|---|
| 1 | කොළඹ | 2,374 |
| 2 | ගම්පහ | 2,433 |
| 3 | කළුතර | 1,306 |
| 4 | ගාල්ල | 1,097 |
| 5 | මාතර | 838 |
| 6 | හම්බන්තොට | 671 |
| 7 | බදුල්ල | 872 |
| 8 | මොණරාගල | 527 |
| 9 | මහනුවර | 1,461 |
| 10 | මාතලේ | 527 |
| 11 | නුවරඑළිය | 725 |
| 12 | කෑගල්ල | 869 |
| 13 | රත්නපුරය | 1,145 |

| අංකය | දිස්ත්‍රික්ක | ජනගහනය ('000) |
|---|---|---|
| 14 | කුරුණෑගල | 1,761 |
| 15 | පුත්තලම | 818 |
| 16 | අනුරාධපුරය | 960 |
| 17 | පොළොන්නරුව | 447 |
| 18 | අම්පාර | 744 |
| 19 | මඩකලපුව | 595 |
| 20 | ත්‍රිකුණාමලය | 442 |
| 21 | යාපනය | 594 |
| 22 | කිලිනොච්චිය | 136 |
| 23 | මන්නාරම | 124 |
| 24 | මුලතිව් | 123 |
| 25 | වව්නියාව | 172 |

මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, *2024*

(i) **වගුව 03** හි දත්ත භාවිත කරමින් පහත දැක්වෙන පන්ති ප්‍රාන්තරවලට අනුව දිස්ත්‍රික්ක කාණ්ඩගත කරන්න: 1-500, 501-1000, 1001-1500, 1501-2000 සහ 2001-2500. (ලකුණු 02)

(ii) ඉහත (i) හි ඔබ සකස් කළ වර්ගීකරණය පදනම් කරගනිමින් රේඛාංකිත සිතියමක් නිර්මාණය කරන්න (මේ සඳහා සපයා ඇති ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් සිතියම භාවිත කරන්න). (ලකුණු 08)

(iii) ඔබ විසින් අඳින ලද සිතියමේ දැක්වෙන පරිදි ශ්‍රී ලංකාවේ ජනගහන ව්‍යාප්තියේ කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iv) රේඛාංකිත සිතියම් ක්‍රමයේ වාසි **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

***


අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

**22 I**

භූගෝල විද්‍යාව I
புவியியல் I
**Geography I**

35819

N




SCALE 1 : 50 000

සමෝච්ච රේඛා අන්තරය අඩි 100
சமவுயரக்கோட்டு இடைவெளி 100 அடி
Contour Interval 100 feet

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

22 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes


අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස් :
* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස - භෞතික භූගෝල විද්‍යාව

1. (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන පාෂාණ සංකීර්ණ හතරක් නම් කරන්න. (ලකුණු 02 යි)
   (ii) ඔබ ඉහත (i) හි නම් කළ එක් පාෂාණ සංකීර්ණයක ලක්ෂණ තුනක් විස්තර කරන්න. (ලකුණු 06 යි)
   (iii) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ලෝහමය නොවන ඛනිජ වර්ග තුනක භූගෝලීය ව්‍යාප්තිය සහ භාවිතය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
   (iv) ශ්‍රී ලංකාවේ ලෝහමය නොවන ඛනිජ නිස්සාරණය නිසා ඇතිවන ප්‍රධාන ගැටලු තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

2. (i) 'යමහල් ක්‍රියාවලිය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)
   (ii) පහත රූප සටහන 01 හි A, B, C, D, E සහ F ලෙස සලකුණු කර ඇති ආක්‍රාන්ත යමහල් භූ රූප හය නිවැරදිව නම් කරන්න. (ලකුණු 06 යි)




රූප සටහන 01

   (iii) කටු සටහන් ඇසුරින් නිෂ්ක්‍රාන්ත යමහල් භූ රූප තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)
   (iv) යමහල් විදාරණය නිසා මානව පරිසරයට ඇතිවන බලපෑම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

3. (i) 'දේශගුණ වෙනස්වීම්' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)
   (ii) ගෝලීය දේශගුණ වෙනස්වීම් සඳහා බලපාන ස්වාභාවික සාධක තුනක් විස්තර කරන්න. (ලකුණු 06 යි)
   (iii) දේශගුණ වෙනස්වීම් නිසා කෘෂිකර්මාන්තයට සිදුවන බලපෑම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
   (iv) ලෝකයේ දේශගුණ වෙනස්වීම්වල බලපෑම අවම කිරීම සඳහා ගත හැකි පියවර තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

[දෙවැනි පිටුව බලන්න.

4. (i) 'පරිසර සංරක්ෂණය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) පහත දැක්වෙන මාතෘකා යටතේ ශ්‍රී ලංකාවේ වනාන්තර පාරිසරික පද්ධතියේ ප්‍රභේද තුන කෙටියෙන් විස්තර කරන්න.

(a) භූගෝලීය ව්‍යාප්තිය

(b) දේශගුණය (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාවේ වනාන්තර පාරිසරික පද්ධති සංරක්ෂණය හා සම්බන්ධ ප්‍රධාන ගැටලු තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ වන සංරක්ෂණය සඳහා ප්‍රයෝජනවත් වන ප්‍රජා සහභාගිත්ව උපාය මාර්ග තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

5. 2001 සහ 2023 වසර සඳහා ප්‍රධාන ප්‍රදේශ අනුව ලෝකයේ ජනගහන ව්‍යාප්තිය හා 2035 සහ 2050 වසර සඳහා ප්‍රක්ෂේපිත ජනගහනය වගුව 01 හි දැක්වේ. එම දත්ත භාවිත කරමින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**වගුව 01 : 2001, 2023, 2035 සහ 2050 වසර සඳහා ප්‍රධාන ප්‍රදේශ අනුව ලෝකයේ ජනගහන ව්‍යාප්තිය**

| ප්‍රදේශය | 2001 | | 2023 | | 2035 | | 2050 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ජන සංඛ්‍යාව (මිලියන) | % | ජන සංඛ්‍යාව (මිලියන) | % | ජන සංඛ්‍යාව (මිලියන) | % | ජන සංඛ්‍යාව (මිලියන) | % |
| ආසියාව | 3,720 | 60.6 | 4,739 | 59.2 | 5,054 | 57.4 | 5,253 | 54.7 |
| අප්‍රිකාව | 818 | 13.3 | 1,453 | 18.1 | 1,865 | 21.1 | 2,417 | 25.3 |
| ලතින් ඇමරිකාව සහ කැරිබියන් | 525 | 8.6 | 652 | 8.1 | 701 | 8.0 | 727 | 7.6 |
| යුරෝපය | 727 | 11.9 | 744 | 9.3 | 746 | 8.4 | 733 | 7.6 |
| උතුරු ඇමරිකාව | 316 | 5.1 | 375 | 4.7 | 394 | 4.5 | 405 | 4.2 |
| ඕෂනියාව | 31 | 0.5 | 45 | 0.6 | 53 | 0.6 | 61 | 0.6 |
| ලෝකය | 6,137 | 100.0 | 8,008 | 100.0 | 8,813 | 100.0 | 9,596 | 100.0 |

මූලාශ්‍රය : *Population Reference Bureau (PRB)*

(i) ප්‍රදේශයක ජනගහන ව්‍යාප්තිය වැදගත් ලක්ෂණයක් ලෙස සලකන්නේ ඇයි? (ලකුණු 02 යි)

(ii) 2001-2023 කාලයේදී ලෝකයේ ප්‍රධාන ප්‍රදේශ අනුව ජන සංඛ්‍යා ව්‍යාප්තියේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) 2023 සිට 2050 දක්වා ලෝකයේ ප්‍රධාන ප්‍රදේශවල ජන සංඛ්‍යා ව්‍යාප්තියේ ප්‍රවණතා තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) ලෝකයේ වැඩිම ජනගහන සංකේන්ද්‍රණයක් ඇති ප්‍රදේශය මුහුණ දෙන ගැටලු තුනක් පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

6. (i) 'නාගරීකරණය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) රටක නාගරීකරණය වැඩිවීම තීරණය කරන සාධක තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දෙන නාගරීකරණයේ ගැටලු තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ නාගරීකරණය අඩු මට්ටමක පැවතීමට බලපාන සාධක තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



7. (i) ලෝකයේ නිෂ්පාදන කර්මාන්තවල ස්ථානගත වීම තීරණය කරන සාධක **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඔබ ඉහත (i) හි දැක්වූ ඕනෑම සාධක **තුනක්** තෝරා ගෙන, එම එක් එක් සාධකය නිෂ්පාදන කර්මාන්ත ස්ථානගත වීම කෙරෙහි බලපාන ආකාරය ලක්ෂණ **දෙකක්** ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාවේ ඕනෑම කර්මාන්ත **තුනක්** තෝරාගෙන එම එක් එක් කර්මාන්තවල ස්ථානගත වීම කෙරෙහි බලපාන සාධක **දෙකක්** බැගින් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ කර්මාන්ත සංවර්ධනය හා සම්බන්ධ ප්‍රධාන ගැටලු **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

8. (i) 'ගෝලීයකරණය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) සංවර්ධනය වෙමින් පවතින රටවල ගෝලීයකරණ ක්‍රියාවලිය වේගවත් කරන වාහක **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික සංවර්ධනයට ගෝලීයකරණයේ බලපෑම් **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ සමාජ හා සංස්කෘතික වෙනස්වීම්වලට ගෝලීයකරණය බලපා ඇති ආකාර **තුනක්** උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

* * *